# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 ඔක්තෝබර්

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල (පැරණි නිර්දේශය)**

(අධ්‍යයන වර්ෂ 2014 සිට 2016 දක්වා)

**සිංහල භාෂා සම්ප්‍රදාය හා කලාශිල්ප SINH - E2025**

සෑම කොටසකින්ම එක් ප්‍රශ්නයක් හෝ අයත් වන සේ
ප්‍රශ්න **පහකට** (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. 'සිංහල භාෂාව, **ඉන්දු-ආර්ය** භාෂා ගණයට ඥාතිත්වයක් ඇති භාෂාවකි.' උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

02. සංස්කෘතික සංස්පර්ශයේ අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙස මිශ්‍ර සිංහලය බිහි වූ අයුරු, **මධ්‍යතන සිංහල** අවධියේ භාෂා ලක්ෂණ ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

03. නූතන සිංහල අවධියේ සිංහල භාෂාව මත පතිත වූ යුරෝපීය භාෂාවන්ගේ බලපෑම කෙටියෙන් පැහැදිලි කර, ඒ අතරින් **ඉංග්‍රීසි** භාෂාවේ ආභාසය වඩාත් කැපී පෙනෙන අයුරු සාකච්ඡා කරන්න.

## II කොටස

04. ''පණකුරු පසෙකි එද ලුහු ගුරු බෙයින් දසවේ.
ගතකුරු ද වේ විස්සෙක් වහරට යුහු සියබසැ''

යන ප්‍රකාශය පාදක කරගනිමින් **සිදත් සඟරාවේ** අක්ෂරමාලාව පිළිබඳ විචාර පූර්වක විග්‍රහයක් කරන්න.

05. සිදත් සඟරාවේ එන **ලිංග භේදය** පිළිබඳ විචාරාත්මක විවරණයක් කරන්න.

06. 'සමාස' ව්‍යාකරණාංගය හඳුන්වා, **විභක්ති සමාසයේ** සියලු ප්‍රභේදයන් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

07. බාහිර හා අභ්‍යන්තර සන්ධි වෙන් වශයෙන් හඳුන්වා සිදත් සඟරාවේ ඉගැන්වෙන **සන්ධි විග්‍රහය** සනිදර්ශනව පරීක්ෂා කරන්න.

## III කොටස

08. ලංකාවේ කලා ශිල්පවල ආරම්භය හා විකාසනය කෙරෙහි බලපෑ ඓතිහාසික සංසිද්ධි පිළිබඳ සමාලෝචනයක් කරන්න.

09. ශ්‍රී ලාංකේය බුදුපිළිමයේ ප්‍රභවය හා විකාසනය පිළිබඳ සසාධක විග්‍රහයක් කරන්න.

**නැතහොත්**

මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදායයට ආවේණික ලක්ෂණ මොනවාදැ යි නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** (02) තෝරාගෙන ප්‍රමාණවත් විග්‍රහයක් ඉදිරිපත් කරන්න.

i. ලාංකේය ස්තූපයේ උපරිභාගය
ii. සීගිරි බිතු සිතුවම්
iii. අනුරාධපුර අවධියේ සඳකඩ පහණ
iv. පොළොන්නරු යුගයේ හින්දු දේව ප්‍රතිමා

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගිනි)

***************************